**රත්නපුර ප්‍රාදේශීය සභාව - 2021**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

රත්නපුර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය  තත්ත්වය  සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**------------------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,  චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,  ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන්  ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂයේ ඉටු කරන ලද කර්මාන්ත 02 කට අදාළව ලැබිය යුතු රු. 1,842,052 ක ප්‍රාග්ධන ආදායම් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එකඟ වෙමි. 2022 ගිණුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | වර්ෂයට අදාල ආදායම් හා ඉකුත් වර්ෂ ගැලපීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පරිත්‍යාග වශයෙන් ලද පිරිවැය රු. 703,866 ක් වූ යන්ත්‍ර උපකරණ සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය තුළ ගැලපීම් සිදුකර නොතිබුණි. | එකඟ වෙමි. 2022 ගිණුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | වර්ෂයට අදාල ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් වනවිට මල්වල පොදු වැසිකිලි පද්ධතිය ඉදිකිරීම සඳහා රු. 3,754,844 ක් වැය දරා සියළු ඇස්තමේන්තුගත වැඩ අවසන් කර තිබුණද, එම පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී වටිනාකම තක්සේරු කර ප්‍රාග්ධනිත කරන බව. | ප්‍රාග්ධන වැය ප්‍රාග්ධනිත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු. 19,971,420 ක වෙනසක් විය. | දීර්ඝකාලීනව පවතින නොසැසඳීම් පෙර වර්ෂ ලේඛන සමඟ සසඳමින් අඩුපාඩු හඳුනාගෙන නිවැරදි කරන බව හා තවදුරටත් පවතින නොසැසඳීම් ඉදිරියේදී නිවැරදි කරන බව. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දැක්වෙන වත්කම්වල වටිනාකම් ඊට අදාල උපලේඛන සමඟ සැසඳිය යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(5) | 2005 සිට 2021 දක්වා වූ කාලපරිච්ඡේදය තුල පළාත් සභා කර්මාන්ත, විශේෂ වැඩසටහන්, ආදායම් බලපත්‍ර ලබා ගැනීම, වාහන නඩත්තු කටයුතු සඳහා ලබාදී තිබූ රු. 1,202,640 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | 2005 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාලව පෙන්වා දී ඇති රු. 1,202,640 ක මුදල පියවීමට ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571(2) | 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල වටිනාකම රු. 5,756,317 ක් වූ කර්මාන්ත තැන්පත් හා විවිධ තැන්පත් වලට අදාල ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | 2010 සිට පැවති කර්මාන්ත තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරන බවත්, 2018 වර්ෂය අවසානය දක්වා පැවති බොහෝ තැන්පතු ආදායමට ගත් බවත්, තවදුරටත් පවතින වසර 02 ඉක්මවා ඇති තැන්පතු ආදායමට ගැනීමට විෂයයභාර නිලධාරීන්ට උපදෙස් දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,402,031 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,243,694 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වෙනත් ආදායම්** | | |
| සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂ දෙකට අදාළව දැන්වීම් පුවරු 32 ක් සඳහා එකතුව රු. 477,100 ක ආදායමක් හිඟව පැවතුණු අතර, සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල වීම නිසා හිඟ ආදායම් අයකර ගැනීමට නොහැකිව තිබුණි. | වර්ෂයේ මුල් දින සිට ගෙවීම් කරන ලෙසට ලිඛිතව දන්වා සිහි කැඳවීම් ද යැවූවද, බොහෝ ආයතන ගෙවීම් පැහැර හරියි. අවසානයේදී ගෙවීම් නොකරන ලද දැන්වීම් පුවරු ගලවා ඉවත් කරන අතර, අදාල ආයතන මුදල් ගෙවා එම දැන්වීම් පුවරු රැගෙන නොයයි. එම තත්ත්වය තුළ එකී දැන්වීම් පුවරු ආදායම සභාවට අහිමි වන බව. | මනා ක්ෂේත්‍ර විපරමක් මඟින් නියමිත ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 ජූලි 02 දින අවශ්‍යතාවයකින් තොරව මිලදී ගන්නා ලද රු. 135,000 ක් වටිනාකමැති වායු සමීකරණ යන්ත්‍රයක් (18000BTU) විගණිත දිනය වූ 2022 අප්‍රේල් 05 දින වනවිට වසර 02 කට අධික කාලයක් තිස්සේ ගබඩාව තුළ නිෂ්කාර්යයව පැවතුණි. | සභාපති වෙනුවෙන් සකස් කිරීමට සැලසුම් කර ඇති කාමරයට සවිකිරීමට මිලදී ගත් බවත්, සභාවේ මූල්‍ය තත්ත්වය යහපත් වුවද, අත්‍යාවශ්‍ය වියදම් සඳහා මුදල් වැය කළ යුතු බැවින් යන්ත්‍රය නිෂ්කාර්යයව පවතින බව. | අවශ්‍යතා නිවැරදිව හා කාලීනව හඳුනාගෙන මිලදී ගැනීම් කළ යුතුය. |
| (ආ) | වීථි පහන් ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳව විධිමත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. 2021 ජූලි හා නොවැම්බර් මාසවලදී එකතුව රු. 1,230,455 ක් වූ වීථි පහන් ඒකක 2454 ක් මිලදී ගෙන තිබුණි. විගණිත දිනය වූ 2022 අප්‍රේල් 05 දින වනවිට මිලදී | වීථි පහන් ලේඛනයේ අඩුපාඩු නිවැරදි කිරීමට විෂයයභාර නිලධාරී දැනුවත් කරන බව හා විගණිත දිනය වනවිට එකී වීථි පහන් අයිතම නිෂ්කාර්යයව පැවති බව. | අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් කර අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

ගෙන මාස 06 සිට මාස 10 දක්වා කල්වූ රු. 1,046,145 ක් වටිනාකමැති විවී පහන් ඒකක 1936 ක් ගබඩාව තුල නිෂ්කාර්යව පැවතුණි.

**3.2 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාපතිවරයාගේ ගමන් සඳහා භාවිතා කරන කැබ් රථයට 2020 මැයි 06 දින යෙදූ ටයර් 04, මාරුකර නැවත 2021 මාර්තු 08 දින රු. 224,000 ක් වැයකර ජපානයේ නිෂ්පාදිත කි.මී. 50,000 ක් පමණ ධාවනය කළහැකි ටයර් මිලදී ගෙන තිබුණි. මිලදී ගත් ටයර් මාස 02 දින 27 ක් තුළ කිලෝමීටර් 8,936 ක් ධාවනය කිරීමෙන් පසු නැවත 2021 මැයි 27 දින විදේශයක නිෂ්පාදිත ටයර් මාරු කිරීම සඳහා රු. 231,600 ක් වැයකර තිබුණි. මෙසේ මාරු කරන ලද ටයර් හඳුනා ගැනීම සඳහා ටයර් මිලදී ගන්නා අවස්ථාවේ එම ටයර්වල සඳහන් හඳුනාගැනීමේ අංක ලොග් පොතෙහි ද දක්වා නොතිබුණි. | ටයර්වල හඳුනාගැනීමේ අංක මින් පෙරද ලොග් පොතට ඇතුළත් කර නොමැති බවත්, කාර්මික නිළධාරි වාර්තාව අනුව පරණ ටයර් ගබඩාවට භාර දී ඇති බවත්, සිදුවී ඇති අඩුපාඩු ඉදිරියේදී සිදු නොවීමට විෂයයභාර නිලධාරී දැනුවත් කිරීමට කටයුතු කරන බව. | ටයර් නිෂ්පාදකයා සහතික කරන අවම දුර හෝ ධාවනය කර මහජන මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව පරිහරණය කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසළ කළමනාකරණ කටයුතු සඳහා සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, සභා බල ප්‍රදේශය තුළ සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය ටොන් 660 ක් පමණ බැහැර කිරීම සඳහා සේවකයින් 14 දෙනෙකු සඳහා | 2019 ජූලි සිට 2021 ජූලි දක්වා රු. 312,000 ක මුදලක් රත්නපුර මහා නගර සභාවේ කසළ අංගනයට ගෙවා ඇති බවත්, කම්කරුවන් 14 දෙනෙකු සේවයේ යෙදී සිටිය ද ස්ථිර වශයෙන්ම කසළ රැස්කිරීම සඳහා යොදවා ඇත්තේ | ජාතික ප්‍රතිපත්ති වලට අනුකූල කසළ කළමනාකරණ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

රු. 6,234,942 ක්ද, වාහනයක් සඳහා රු. 691,121 ක්ද ලෙස එකතුව රු. 6,926,063 ක පිරිවැයක් දරා තිබුණි. සභාව සතුව විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් දිරන කසළ එකතු කර රත්නපුර මහා නගර සභාවේ කසළ අංගනයට භාරදී තිබුණි.

රියදුරෙකු සහ සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු බව.